ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව
காணி ஆணையாளர் நாயகத்தின் திணைக்களம்
LAND COMMISSIONER GENERAL'S DEPARTMENT

"මිහිකත මැදුර", ඉඩම් මහලේකම් කාර්යාලය, 1200/6, රජමල්වත්ත පාර, බත්තරමුල්ල.
"மிஹிகத்த மெதுர", காணிச் செயலகம், 1200/6, இராஜமல்வத்த வீதி, பத்தரமுல்ல.
"Mihikatha Medura", Land Secretriat 1200/6, Rajamalwatta Road, Battaramulla.

011 279 7400
011 286 4051


මගේ අංකය / எனது இல / My No. L2/1/65/චක්‍රලේඛ/2021 | ඔබේ අංකය / உமது இல / Your No | දිනය / திகதி / Date 2021.07.20

චක්‍රලේඛ අංක - 2021/5

සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන්,

**සුනාමි දීමනාපත්‍ර සම්බන්ධයෙන් මතු වී ඇති ගැටළු නිරාකරණය කර ගැනීම.**

සුනාමි ව්‍යවසනයෙන් විපතට පත්වූවන්ට නිවාස ලබාදීමේ පරමාර්ථයෙන් රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන සහ ශ්‍රී ලංකා රජය ඒකාබද්ධව සුනාමි නිවාස ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කර ඇති අතර එම නිවාස සහිත ඉඩම බැහැර කිරීමේදී රජයේ ඉඩම් ආඥා පනතේ 2 වගන්තිය ප්‍රකාරව නොමිලේ දීමනාපත්‍ර ලබාදීමට තීරණය කර ඇත. මෙම දීමනාපත්‍ර ලබාදීමේ ප්‍රතිපත්ති තීරණය අනුව එම දීමනාපත්‍රලාභීන් හා එම ඉඩම් භුක්ති විඳින පුද්ගලයන් ද විවිධ ප්‍රායෝගික දුෂ්කරතාවයන්ට මුහුණ දෙන බැවින් එම ගැටළු නිරාකරණය කර ගැනීම සඳහා වූ ඉල්ලීම් පිලිබඳව සලකා බලා එම ගැටළු විසදීම සඳහා වූ යෝජනා ජනාධිපති ලේකම් වෙත ඉදිරිපත් කරන ලද අතර ඒ සඳහා ජනාධිපති ලේකම්ගේ PS/CSA/00/6/1 හා 2021.05.11 දිනැති ලිපිය අනුව අනුමැතිය හිමි වී ඇත. ඒ අනුව සුනාමි දීමනාපත්‍ර බැහැර කිරීම සඳහා ක්‍රමවේදයක් හඳුන්වා දීම සඳහා උපදෙස් ලබාදීම මෙම චක්‍රලේඛය නිකුත් කිරීමේ අරමුණ වේ.

**01. සුනාමි දීමනාපත්‍රයේ II වන උපලේඛණයේ සඳහන් කොන්දේසි හේතුවෙන් දීමනාපත්‍රලාභීන් මුහුණ දෙන ගැටළු නිරාකරණය කිරීම.**

මෙම දීමනා පත්‍ර ඉඩම්වල හිමිකම වසර 10 ක් යනතෙක් රජයේ අයිතිය යටතේ තබාගත යුතුය යන ප්‍රතිපත්තියට අනුව මෙම කොන්දේසිය දීමනාපත්‍රයට ඇතුලත් කර ඇත. එසේ වුවද දීමනාපත්‍ර ලබාදීමේ ක්‍රමවේදයෙහි පවතින ප්‍රායෝගික සංකීර්ණභාවය හේතුවෙන් භෞතිකව ඉඩමේ භුක්තියට පැමිණි දිනය, ඉඩම බැහැර කිරීම සඳහා, අතිගරු ජනාධිපතිතුමාගේ ලිපිගත අනුමැතිය ලද දිනය හා දීමනා පත්‍රය ප්‍රදානය කරන ලද දිනය අතර පැහැදිලි කාල පරාසයක් දක්නට ලැබේ. එබැවින් II වන උපලේඛණයේ කොන්දේසියේ සඳහන් ප්‍රදානය කරන ලද දිනය වෙනුවට අතිගරු ජනාධිපතිතුමාගේ ලිපිගත අනුමැතිය ලද දිනය ලෙස යොදාගැනීමට අනුමැතිය හිමිවී ඇත.

1.1 ඒ අනුව ඉදිරියේදී සුනාමි දීමනාපත්‍රවල II වන උපලේඛනයෙහි කොන්දේසියේ අන්තර්ගත ප්‍රදානය කරන ලද දින යන්න වෙනුවට "අතිගරු ජනාධිපතිතුමාගේ ලිපිගත අනුමැතිය ලද දින" යන්න යොදමින් සංශෝධනය කිරීමට කටයුතු කරනු ලැබේ.

1.2 දැනටමත් නිකුත්කර ඇති සුනාමි දීමනාපත්‍ර ලාභීන් විසින් මෙම දීමනා පත්‍ර සම්බන්ධයෙන් අතුරු බද්දීම, කුලියට දීම, අන්සතු කිරීමක් සම්බන්ධයෙන් වූ ඉල්ලීමක් ඔබ වෙත ඉදිරිපත් කරන්නේ නම් මෙහි ඇමුණුම - 01 ආකාරයෙන් ඒ සඳහා මාගේ පූර්ව අනුමැතිය ලබාගත යුතු අතර අතිගරු ජනාධිපතිතුමාගේ ලිපිගත අනුමැතිය ලබාදුන් දින සඳහන් කරමින් එතැන් සිට වසර 10 ක් ගත වී තිබේනම් ඒ බව මා විසින් ඔබ වෙත දන්වා එවනු ඇත. මාගේ පූර්ව අනුමැතිය ලබාගැනීමෙන් පසුව මෙහි ඇමුණුම - 02 හි සඳහන් ආකෘතිය ප්‍රකාරව දීමනාපත්‍රයේ කොන්දේසිය සංශෝධනය කිරීමට අවශ්‍ය කටයුතු කල යුතුය. එම අනුමැතිය ලබාදුන් ලිපිය දීමනාපත්‍රය සමග අමුණා තබාගත යුතු බවට දීමනාපත්‍ර ලාභීන් දැනුවත් කළ යුතුය.

1.3 සුනාමි දීමනාපත්‍රලාභියෙකු විසින් අතිගරු ජනාධිපතිතුමාගේ ලිපිගත අනුමැතිය ලද දින සිට වසර 10 ක් ඉක්මවවීමට පෙරාතුව දීමනාපත්‍රය බැංකු/ බැංකු නොවන මූල්‍ය ආයතනයකට උකසක් ලෙස තබා ණය මුදලක් ලබාගැනීමට ඉල්ලීම් කරන්නේ නම් එම ඉල්ලීම පිළිබඳ සලකා බැලිය හැකි වන්නේ පහත කොන්දේසි සම්පූර්ණවන්නේනම් පමණි.

1. දීමනාපත්‍රය නිකුත් කිරීම සඳහා අතිගරු. ජනාධිපතිතුමාගේ ලිපිගත අනුමැතිය ලද දින සිට වසර පහක් ගතවී තිබීම.
2. බැංකුව/ බැංකු නොවන මූල්‍ය ආයතනයේ එකඟතාවය ලබා දී තිබීම.

මෙම කොන්දේසි සපුරන අවස්ථාවකදී මෙහි ඇමුණුම - 03 ආකෘතිය මගින් එම උකස් තැබීම සඳහා අවසරය ලබාදීමට කටයුතු කළ යුතුය. දීමනාපත්‍ර කරු විසින් ණය ගෙවීම පැහැර හරින අවස්ථාවක දී ප්‍රාදේශීය ලේකම්ගේ පූර්ව අනුමැතිය මත ඉඩම වෙන්දේසිකර සුදුසු ගැනුම්කරුවෙකු වෙත විකිණීමට බැංකුවට/ මූල්‍ය ආයතනයට හැකියාව ඇත. එම අවද්ථාවේ දී ඉඩමේ වෙන්දේසි වටිනාකමින් 10% රජයේ ඒකාබද්ධ අරමුදලට බැර කිරීමට බැංකුව/ මූල්‍ය ආයතනය බැඳීසිටියි. එබැවින් යම් අවස්ථාක දී මෙම ක්‍රමවේදය යටතේ උකස් තැබීම සඳහා අනුමැතිය ලබාදුන් ඉඩම් සම්බන්ධයෙන් වෙනම ලේඛණ පවත්වාගත යුතු අතර නිරන්තර පසු විපරම් කළ යුතුය.

**02. සුනාමි ඉඩම් ප්‍රතිලාභින් නොවන වෙනත් පාර්ශවයන් විසින් එම ඉඩම් හා නිවාස භුක්ති විදින අවස්ථාවලදී කටයුතු කළයුතු ආකාරය.**

සුනාමි දීමනාපත්‍ර වැඩසටහන යටතේ දීමනා පත්‍රයක් ලැබීමට හිමිකම් ලබන්නේ සුනාමි ව්‍යවසනයෙන් විපතට පත් අයෙකු පමණි. එසේ නොවන වෙනත් පාර්ශවයක් විසින් මෙම ඉඩම් භුක්ති විදින්නේ නම් එම අය මෙම වැඩසටහන යටතේ ලබාදෙන ප්‍රතිලාභ ලැබීමට හිමිකම් නොලබනු ඇත. අතිගරු ජනාධිපතිතුමාගේ

බැහැර කිරීම දීමනා පත්‍රයේ කොන්දේසිවලට පටහැනි වන බැවින් ශුන්‍ය හා බලරහිත බැවින් එවැනි පුද්ගලයන් ද අවිධිමත් ඉඩම් භුක්තිවිඳින්නන් සේ හඳුනාගත යුතුය.

එසේ අවිධිමත්ව සුනාමි ඉඩම් භුක්ති විඳින පුද්ගලයන් මාගේ 2008/4 හා 2008/4 (1) චක්‍රලේඛ අනුව විධිමත් තෝරාගැනීමකට ලක්කර රජයේ ඉඩම් ආඥා පනත යටතේ නේවාසික කටයුතු සඳහා දීර්ඝ කාලීන බදු ලබාදීමට කටයුතු කල යුතුවේ. එසේ විධිමත් තෝරාගැනීමකට ලක්කළ බදුකරුවන් මාගේ 2020/4 චක්‍රලේඛයේ කොන්දේසි සම්පූර්ණ කරන අවස්ථාවල දී එම ඉඩම පූර්ණ අයිතිය ඇති නිදහස් දීමනා පත්‍රයක් මගින් බැහැර කිරීම සඳහා අවශ්‍ය ලේඛණ මා වෙත එවිය යුතුය. සුනාමි ව්‍යාපෘතිය සඳහා අත්පත් කරගත් ඉඩමක් සම්බන්ධයෙන් වුවද, එම ඉඩම නේවාසික කටයුත්තක් සඳහාම යොදවාගන්නා බැවින් අත්පත් අරමුණ සංශෝධනයෙන් තොරව ඉහත පරිදි කටයුතු කිරීමට හැකියාව පවතී.

**3. සුනාමි දීමනා පත්‍ර ලාභීන් මියගිය විට දී කටයුතු කළයුතු ආකාරය.**

සුනාමි දීමනාපත්‍ර රජයේ ඉඩම් ආඥා පනතේ 2 වගන්තිය යටතේ ලබාදෙන දීමනාපත්‍ර බැවින් දීමනාපත්‍ර කරුගේ මරණින් පසුව සාමාන්‍ය උරුම නීතිය ප්‍රකාරව උරුම අයිතිවාසිකම් හිමිවන බැවින් ඒ සඳහා මැදිහත්වීමක් අවශ්‍ය නොවේ.

**3.1 අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රතිරූප අත්සන යෙදීමට ප්‍රථම දීමනාපත්‍රලාභියා මියගොස් ඇති අවස්ථාවක එම දීමනාපත්‍රය වලංගු නොවන බැවින් එවැනි අවස්ථාවක කටයුතු කළයුතු ආකාරය**

මෙම අවස්ථාවේදී ද සාමාන්‍ය උරුම නීතිය ප්‍රකාරව අයිතිවාසිකම් හිමි වේ. එසේ වුවත් කලත්‍රයා හැර අනෙකුත් උරුමකරුවන්ගේ එකඟතාවයෙන් කලත්‍රයා වෙත හෝ කලත්‍රයා ඇතුළු අනෙකුත් උරුමකරුවන්ගේ එකඟතාවයෙන් එක් උරුමකරුවෙකු වෙත ලබාදීමට හැකියාව ඇති බැවින් එම ප්‍රතිලාභියා නමින් සකස් කරන ලද සුදීප 1, සුදීප 2, සුදීප 3 ලේඛණ සමග පහත සඳහන් ලේඛණ පළාත් ඉඩම් කොමසාරිස්/ අන්තර් පලාත් ඉඩම් කොමසාරිස්/ සහකාර ඉඩම් කොමසාරිස් මගින් ඔබගේ නිර්දේශය සහිතව මා වෙත එවීමට කටයුතු කළ යුතුය.

1. මුල් ප්‍රතිලාභායාගේ මරණ සහතිකය
2. ඥාතිත්වය සනාථ කිරීමේ ලේඛණය
3. පවුලේ සාමාජිකයන් සම්බන්ධයෙන් ග්‍රාම නිලධාරි වාර්තාව
4. උරුමකරුවන්ගේ එකඟතාවය දැක්වෙන දිවුරුම් ප්‍රකාශය
5. දීමනාපත්‍රයක් නිකුත් කර තිබේ නම් එම දීමනාපත්‍රය හා අනු පිටපත්
6. රේඛා චිත්‍රය

3.2. අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රතිරූප අත්සන යෙදීමෙන් අනතුරුව දීමනාපත්‍ර ලාභියා මියගොස් ඇති අවස්ථාවලදී එම දීමනාපත්‍රය වලංගු බැවින් එය ලියාපදිංචි කර අදාළ උරුමකරුවන් වෙත භාරදීමට කටයුතු කළ යුතුය.

මෙම චක්‍රලේඛය අනුව කටයුතු කිරීමේදී යම් ගැටළුවක් වේ නම් මා විමසන්න.

ජී.ඩී.කීර්ති ගමගේ

ඉඩම් කොමසාරිස් ජනරාල්

පිටපත් :

1. ජනාධිපති ලේකම්, ජනාධිපති කාර්යාලය
2. ලේකම්, ඉඩම් අමාත්‍යාංශය
3. ලේකම්, ආරක්ෂක අමාත්‍යාංශය
4. සියලුම දිස්ත්‍රික් ලේකම්වරු
5. සර්වේයර් ජනරාල්, සර්වේයර් ජනරාල් දෙපාර්තමේන්තුව
6. අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය
7. සභාපති, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව
8. විගණකාධිපති, ජාතික විගණන කාර්යාලය
9. සියලුම පළාත් ඉඩම් කොමසාරිස්වරුන්
10. සියලුම ඉඩම් කොමසාරිස්වරුන්/සහකාර ඉඩම් කොමසාරිස් (අන්තර් පළාත්)

} දැ.ගැ.ස.